# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,384 - 2024 මැයි මස 10 වැනි සිකුරාදා - 2024.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 466 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 476 |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 මැයි 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මැයි 17 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## කොටගල ප්‍රාදේශීය සභාව

### කොටගල ප්‍රාදේශීය සභාවට අයත් රොසිටා පොදු වෙළඳපොළෙහි ඉඩම් කොටසක් බදු දීම සඳහා ලංසු කැඳවීම

01. කොටගල ප්‍රාදේශීය සභා බල සීමාවේ පිහිටි පහත උපලේඛනයේ සඳහන් රොසිටා පොදු වෙළඳපල පහත මාලයේ 10' x 14' ප්‍රමාණයේ ඉඩම් කොටසක් බදු දීම සඳහා මුල් පිටපත හා අනු පිටපත වශයෙන් පිටපත් දෙකකින් යුක්තව සීල් තබන ලද ලංසු 2024.05.31 දින පෙරවරු 10.00 දක්වා මා විසින් භාර ගනු ලැබේ.

02. මෙම ඉඩම් කොටස ලබා ගැනීමට අපේක්ෂා කරන අය 2024.05.10 දින සිට 2024.05.30 වන දින පස්වරු 03.00 දක්වා පහත උපලේඛනයේ සඳහන් ලංසු පෝරම ගාස්තු සහ ලංසු තැන්පත් මුදල ගෙවා පෝරම ලබාගත හැකි ය.

03. එම ලංසු කොන්දේසි කියවා බලා 2024.05.31 වැනි දින පෙරවරු 10.00 ට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, කොටගල ප්‍රාදේශීය සභාව, කොටගල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ සභාවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලීමෙන් හෝ ලංසු ඉදිරිපත් කළ හැකිය. ඉහත දින නියමිත වේලාවට ලංසු ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත් ඒ පිළිබඳ ටෙන්ඩර් මණ්ඩලය ගන්නා තීරණය අවසන් තීරණය වේ. ලංසු අයදුම් පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ රොසිටා පොදු වෙළඳපල ඉඩම බදු ලබා ගැනීම යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

04. එම ලංසු 2024.05.31 වැනි දින පෙරවරු 11.00 ට කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී විවෘත කනු ලබන හෙයින් එම අවස්ථාවට ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු සහභාගි විය යුතු ය.

05. මෙකී ඉඩම් කොටස බදු දීමට අදාළ සියලුම කොන්දේසි ලංසු පෝරම සමග නිකුත් කරනු ලැබේ.

**ඉඩම් කොටස පිළිබඳ විස්තර**

| *අනු. අංකය* | *විස්තරය* | *ආපසු ගෙවනු ලබන ලංසු තැන්පත් මුදල රුපියල්* | *ආපසු නොගෙවන ලංසු පෝරම ගාස්තුව රුපියල්* |
|---|---|---|---|
| 01 | කොටගල රොසිටා පොදු වෙළඳපොලෙහි 10'.0" x 14'.0" | 2,500.00 | 500.00 |

ලේකම්,
කොටගල ප්‍රාදේශීය සභාව.

2024 මැයි මස 10 වැනි දින.

05-88

---

## පළාත් පාලන දෙපාර්තමේන්තුව - දකුණු පළාත

### දියුණු කළ ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම අනුමත කිරීම පිළිබඳ නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2019.09.10 දින අංක (ඉ) 15 දරන තීරණය යටතේ දියුණු කළ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ මෙහි පහත සඳහන් යෝජනා සම්මතය ඉහත කී වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල යටතේ අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

චන්දන කේ. සෙනෙවිරත්න,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්,
මාතර දිස්ත්‍රික්කය.

2023 දෙසැම්බර් මස 05 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ දී ය.

### යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ ද, පහත උපලේඛනයේ ඇතුළත් කර ඇති සිතියමෙන් හා ඒ සමග විස්තර කෙරෙන සීමා ඇතුළත පිහිටියා වූ ද, ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට ද, මේ යෝජනා සම්මතය සඳහා මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමතය ලබා ගත යුතු බවට සහ එකී ප්‍රදේශයේ පිහිටියා වූ සියලු නිශ්චල දේපළ වල සහ නිශ්චල දේපළ වර්ගවල වාර්ෂික වටිනාකම් තක්සේරු කිරීමටත්, එසේ තක්සේරු කරන ලද වාර්ෂික වටිනාකම් මත වරිපනම් නියම කිරීමටත්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දකුණු පළාතේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඉල්ලා සිටිය යුතු යැයි කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරයි.




දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි වර්ග කිලෝමීටර් 2.71 ක් සහ පරිමිතිය කිලෝමීටර් 15 ක් වූ දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට යෝජිත ප්‍රදේශයට මායිම්:

A. කිරින්ද කඹුරුපිටිය පාර මංසන්ධියෙන් පටන් ගෙන මාතර පාර දකුණ පාසල් මාවත මංසන්ධිය දක්වා (1.2 Km) ගොස් පාසල් මාවත දකුණු ප්‍රදේශය අයත් වන පරිදි පාසල් මාවත අවසාන වී කඹුරුපිටිය මාර්ගයට වැටෙන මන්සන්ධිය දක්වා 1.3Km) ගොස් කිරින්ද කඹුරුපිටිය පාර මංසන්ධියේ සිට පාසල් මාවත මංසන්ධිය දක්වා වූ (1.1 Km) කඹුරුපිටිය පාර වම කුඹුරු වලින් හා ගොඩ බිමින් වෙන් වන ප්‍රදේශය,

B. කිරින්ද කඹුරුපිටිය පාර මංසන්ධියෙන් පටන් ගෙන 1Km කඹුරුපිටිය පාර දකුණ බුද්ධජයන්ති මාවත දක්වා ගොස් බුද්ධ ජයන්ති මාවතේ 400 m ඇතුළතින් මායිම් වන ඇල මාර්ගය දක්වා ප්‍රදේශය සහ කඹුරුපිටිය පාර මංසන්ධියේ සිට හක්මන පාර වම 13 කණුව දක්වා (0.7 Km) ගොස් ගල්කන්ද මාර්ගයේ 200m ගිය තැන පිහිටි ඇල මාර්ගයන් මායිම් වන ප්‍රදේශය.

C. කිරින්ද කඹුරුපිටිය පාර මංසන්ධියෙන් පටන්ගෙන හක්මන පාර දකුණ මහහේන පාරේ මංසන්ධිය දක්වා වූ (1.4km) මහහේන මාර්ගයේ 200m අවසාන වන තැන පිහිටි හරස් මාර්ගයෙන් අවසන් වන මංසන්ධියෙන් ගොස් වෙල්යායෙන් වෙන් වූ ගොඩබිම් ප්‍රදේශය සහ කිරින්ද හක්මන පාර ධම්මානන්ද මාවත මංසන්ධියෙන් පටන්ගෙන එම මාර්ගයෙහි අවසාන වන බෙලිඅත්ත පාර මංසන්ධිය දක්වා (2.2 Km) කුඹුරු වලින් වෙන් වූ ගොඩබිම් ප්‍රදේශය,

D. මාතර හක්මණ පාර ගැටමාන්න පාර මංසන්ධියෙන් පටන් ගෙන සුවඳ කැකුණ වැව මාර්ගය (0.7Km) මංසන්ධිය දක්වා ගොඩබිම් හා වෙල්යායෙන් වෙන් වූ ප්‍රදේශය සහ ගැටමාන්න පාර සුවඳ කැකුණ වැව මාර්ගයේ සිට සාරානන්ද මාවත මංසන්ධිය (0.4 Km) දක්වා සුවඳ කැකුණ වැව මාර්ගයේ සහ සාරානන්ද මාවත දකුණු ප්‍රදේශය සහ සාරානන්ද මාවත මාර්ගය අවසානයේ පුවක්ගහ මඩිත්ත පාර මංසන්ධිය දක්වා ගොස් නැවත පුවක්ගහ මඩිත්ත පාර ඔස්සේ වඩුගෙදර මාර්ගයේ මංසන්ධිය දක්වා 0.5Km නැවත වඩුගෙදර 11කණුව මාර්ගය අවසානයේ හක්මන පාර මංසන්ධිය දක්වාවූ 0.6 Km දකුණු පස ගෙවතු හා වානිජ බෝග වලින් වෙන් වූ කලාපය, හක්මන පාර ඉළුක්හේන මාර්ගය මංසන්ධිය දක්වා (1.1 Km) වූ වම් ප්‍රදේශය,

E. මාතර පාර දකුණ පාසල් මාවත මංසන්ධියේ සිට සභා සීමාව අවසානය දක්වා වූ මාර්ගයේ 200 m ඇතුළත පමණ පිහිටි ගොඩබිම හා ඇල මාර්ගයෙන් වෙන් වන ප්‍රදේශය (1.20 Km)

05-60

---

**කොළඹ මහා නගර සභාව**

හිඟ වරිපනම් බදු සහ වරෙන්තු ගාස්තු නොගෙවීම නිසා දේපළ විකිණීම

පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දේපළ වෙනුවෙන් අයවිය යුතු හිඟ වරිපනම් බදු හා වරෙන්තු ගාස්තු අයකර ගැනීමට, තහනම් කිරීම සඳහා චංචල දේපළ නොමැති කල්හි මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 252 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය පිට තහනම් කරන ලද දේපළ වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් බදු සහ වරෙන්තු ගාස්තු යථා කාලයේ දී ගෙවනු නොලැබුවහොත් එකී දේපළ එකී උපලේඛනයේ සඳහන් දිනයන් හා වේලාවන් හි දී මහා නගර සභා ආඥාපනතේ 256 වැනි වගන්තිය ප්‍රකාර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

ජේ. එම්. හඳානි ජයවර්ධන,
නාගරික කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව.

**සැළකිය යුතුයි :**

1. ඉහත සඳහන් දේපළ සම්බන්ධයෙන් අය වීමට ඇති හිඟ මුදල් ගෙවීමට පෙර මෙම කාර්යාලයට පැමිණ ගණකාධිකාරි, (වරිපනම්) හමු වී අදාළ තොරතුරු ලබා ගන්නා මෙන් දන්වමි.

2. මෙම දේපළට අදාළ 2024.03.31 දක්වා කරන ලද ගෙවීම් සියල්ල අඩුකර ඇත. ඊට අදාළ සටහන් නොවූ ගෙවීම් තිබේ නම් අදාළ ගණකාධිකාරි හමු වී නිරවුල් කර ගත හැකි ය.

3. හිඟ ශේෂය දක්වන දේපළ වල වරිපනම් ලිහිල් කිරීම, අඩු/වැඩි කිරීම් සියල්ල ගලපා ශේෂය ගෙන ඇති අතර මෙම ගැලපීම පිළිබඳව ඔබ එකඟ නොවෙන්නේ නම් අදාළ තහවුරු කිරීමේ ලිපි රැගෙන ගණකාධිකාරි (වරිපනම්) හමු වී නිරවුල් කර ගත හැකි ය.

| *කොට්ඨාස අංකය* | *කොට්ඨාසය* | *අංකය* | *වීදියේ නම* | *වෙන්දේසි දිනය* | *වේලාව* |
|---|---|---|---|---|---|
| 6 | බ්ලූමැන්ඩල් | 469/2 | සිරිමාවෝ බණ්ඩාරනායක මාවත | 2024.06.05 | පෙ. ව. 10.00 |
| | | 722 | එම | 2024.06.05 | පෙ. ව. 10.15 |
| 7 | කොටහේන නැගෙනහිර | 279 3/1 | කේ. බී. ක්‍රිස්ටි පෙරේරා මාවත | 2024.06.05 | පෙ. ව. 10.45 |
| | | 279 2/1 | එම | 2024.06.05 | පෙ. ව. 10.50 |
| | | 279 1/1 | එම | 2024.06.05 | පෙ. ව. 10.55 |

| කොට්ඨාශ අංකය | කොට්ඨාශය | අංකය | වීදියේ නම | වෙන්දේසි දිනය | වේලාව |
|---|---|---|---|---|---|
| 9 | කොච්චිකඩේ - උතුර | 47 3/1 | මුහුදු වීදිය | 2024.06.05 | පෙ. ව. 11.15 |
| | | 53 | එම | 2024.06.05 | පෙ. ව. 11.20 |
| | | 192 | එම | 2024.06.05 | පෙ. ව. 11.45 |
| | | 308 | එම | 2024.06.05 | ප. ව. 12.00 |
| 11 | මසංගස්වීදිය | 32 | මොහොමඩ් සෙයින් මාවත | 2024.06.06 | පෙ. ව. 11.30 |
| | | 164 | මහා විද්‍යාල මාවත | 2024.06.06 | පෙ. ව. 11.15 |
| | | 220 | අළුත් යොන් වීදිය | 2024.06.06 | ප. ව. 12.20 |
| | | 279 | පරණ යොන් වීදිය | 2024.06.06 | ප. ව. 12.45 |
| 15 | මාලිගාවත්ත බටහිර | 129/1 | ජයන්ත වීරසේකර මාවත | 2024.06.11 | පෙ. ව. 10.15 |
| | | 151/23 | එම | 2024.06.11 | පෙ. ව. 10.25 |
| | | 305 | එම | 2024.06.11 | පෙ. ව. 10.30 |
| | | 307 | එම | 2024.06.11 | පෙ. ව. 10.35 |
| | | 311 | එම | 2024.06.11 | පෙ. ව. 10.40 |
| | | 165 | මාලිගාවත්ත ජුම්මා මස්ජිඩ් පාර | 2024.06.11 | පෙ. ව. 11.35 |
| | | 173 | එම | 2024.06.11 | පෙ. ව. 11.40 |
| | | 310 | ශ්‍රී සංඝරාජ මාවත | 2024.06.11 | පෙ. ව. 10.00 |
| | | 319 | ජයන්ත වීරසේකර මාවත | 2024.06.11 | පෙ. ව. 10.50 |
| | | 67/3B | මාලිගාවත්ත පෙදෙස | 2024.06.11 | පෙ. ව. 11.00 |
| | | 67/14A | මාලිගාවත්ත පෙදෙස | 2024.06.11 | පෙ. ව. 11.00 |
| 16 | අළුත්කඩේ නැගෙනහිර | 15 | ඔයිල්මන්ස් වීදිය | 2024.06.06 | පෙ. ව. 10.10 |
| 17 | අළුත්කඩේ බටහිර | 188 | හසල්ඩෝෆ් වීදිය | 2024.06.06 | පෙ. ව. 10.30 |
| | | 44 | එම | 2024.06.06 | පෙ. ව. 10.00 |
| | | 64 1/1 | එම | 2024.06.06 | පෙ. ව. 10.20 |
| | | 95 3/2 | පීර සයිබෝ වීදිය | 2024.06.06 | පෙ. ව. 10.55 |
| | | 77 | එම | 2024.06.06 | පෙ. ව. 10.45 |
| 20 | කොටුව | 39 | කැනල් රෝ | 2024.06.05 | ප. ව. 12.20 |
| | | 90/1 | චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත | | ප. ව. 12.40 |

| කොට්ඨාස අංකය | කොට්ඨාසය | අංකය | වීදියේ නම | වෙන්දේසි දිනය | වේලාව |
|---|---|---|---|---|---|
| 24 | සුදුවැල්ල | 66 M/1 | පාර්ක් පාර | 2024.06.13 | පෙ. ව. 10.00 |
| 28 | මාලිගාවත්ත නැගෙනහිර | 465 | දෙමටගොඩ පාර | 2024.06.12 | පෙ. ව. 9.45 |
| | | 146 | මාලිගාවත්ත ජුම්මා මස්ජිඩ් පාර | 2024.06.11 | පෙ. ව. 11.20 |
| | | 204 | එම | 2024.06.11 | ප. ව. 11.55 |
| | | 103 1/1 | ශ්‍රී සද්ධර්ම මාවත | 2024.06.11 | ප. ව. 12.15 |
| 29 | දෙමටගොඩ | 658 | ඩැනිස්ටර් ද සිල්වා පාර | 2024.06.12 | පෙ. ව. 10.00 |
| | | 658/1 | එම | 2024.06.12 | පෙ. ව. 10.05 |
| | | 101 | කොලොන්නාව පාර | 2024.06.12 | පෙ. ව. 11.05 |
| | | 103 | එම | 2024.06.12 | පෙ. ව. 11.10 |
| | | 201 | එම | 2024.06.12 | පෙ. ව. 10.50 |
| | | 57 | එම | 2024.06.12 | පෙ. ව. 11.00 |
| | | 94 | එම | 2024.06.12 | පෙ. ව. 11.30 |
| | | 96 | එම | 2024.06.12 | පෙ. ව. 11.25 |
| | | 99 | එම | 2024.06.12 | පෙ. ව. 11.20 |
| | | 154 | ශ්‍රී ධර්මාරාම පාර | 2024.06.12 | පෙ. ව. 10.50 |
| | | 158 | එම | 2024.06.12 | පෙ. ව. 10.55 |
| | | 85 | එම | 2024.06.12 | පෙ. ව. 10.20 |
| | | 127/108 | එම | 2024.06.12 | පෙ. ව. 10.35 |
| | | 151 බී | එම | 2024.06.12 | පෙ. ව. 10.40 |
| 34 | නාරාහේන්පිට | 280 | එන්. එච්. පෙරේරා මාවත | 2024.06.12 | පෙ. ව. 11.55 |
| | | 151/3 | ඩඩ්ලි සේනානායක මාවත | 2024.06.12 | ප. ව. 12.05 |
| | | 159 | එම | 2024.06.12 | ප. ව. 12.10 |
| 35 | බොරැල්ල දකුණ | 60 | එන්. එච්. පෙරේරා මාවත | 2024.06.12 | පෙ. ව. 11.45 |
| 36 | කුරුඳුවත්ත | 175 3/1 | කිංසි පාර | 2024.06.12 | ප. ව. 12.40 |
| | | 11 | එර්නස්ට් ද සිල්වා මාවත | 2024.06.12 | ප. ව. 01.35 |
| | | 40 | ඥාණාර්ථ ප්‍රදීප පාර | 2024.06.12 | ප. ව. 12.55 |
| | | 148 | ඊ. ඩබ්ලිව්. පෙරේරා මාවත | 2024.06.12 | ප. ව. 01.10 |
| | | 40 4/1 | විජේරාම මාවත | 2024.06.12 | ප. ව. 12.25 |

| කොට්ඨාස අංකය | කොට්ඨාසය | අංකය | වීදියේ නම | වෙන්දේසි දිනය | වේලාව |
|---|---|---|---|---|---|
| 38 | බම්බලපිටිය | 686/A | කොල්ලුපිටිය පාර | 2024.06.13 | පෙ. ව. 10.25 |
| 46 | පාමංකඩ | 30/7 | හැම්ඩන් පටුමග | 2024.06.13 | පෙ. ව. 10.55 |
| | | 201 | ඩබ්ලිව්. ඒ. සිල්වා මාවත | 2024.06.13 | පෙ. ව. 10.45 |
| 47 | වැල්ලවත්ත දකුණ | 350 | ගාලු පාර | 2024.06.13 | ප. ව. 12.15 |
| | | 368 | එම | 2024.06.13 | ප. ව. 12.00 |
| | | 523 | එම | 2024.06.13 | පෙ. ව. 11.35 |
| | | 569 | එම | 2024.06.13 | පෙ. ව. 11.50 |
| | | 523 1/1 | එම | 2024.06.13 | පෙ. ව. 11.40 |
| | | 523 2/1 | එම | 2024.06.13 | පෙ. ව. 11.45 |
| | | 16 | රාමක්‍රිෂ්ණා පාර | 2024.06.13 | පෙ. ව. 11.15 |
| | | 20 | ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන පාර | 2024.06.13 | පෙ. ව. 10.30 |
| | | 69 | ශ්‍රී බෝධිරුක්ඛාරාම මාවත | 2024.06.13 | පෙ. ව. 11.05 |
| | | 21/1 1/1 | නෙල්සන් පෙදෙස | 2024.06.13 | ප. ව. 12.30 |
| | | 75/9 1/1 | රාජගුරු ශ්‍රී සුබුද්ධි පාර | 2024.06.13 | ප. ව. 12.45 |

05-83

---

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

### ගෝසාතකාර බලපත්‍ර නිකුත් කිරීම සඳහා විරෝධතා කැඳවීම

" දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහළ තල්දූව ග්‍රාම නිලධාරි වසමේ එම්. කේ. උම්මු රෂීනා යන අයට අයත් කඩවතගාව ඕවිටේවත්ත නැමැති ඉඩම තුළ එම්. එන්. එම්. සෆ්රාස් ජාන් යන අයට අයත් ස්ථිර ගෝසාතකාගාරයක් ඉදිකර පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා දීම සම්බන්ධයෙන් වන විරෝධතාවයන් මා විසින් කැඳවනු ලබයි. එම විරෝධතාවයන් පිටපත් දෙකකින් යුක්තව 2024.05.10 දින සිට 2024.05.24 දින දක්වා පෙ. ව. 9.00 ත් ප. ව. 3.00 ත් අතර කාලය තුළ ලේකම්, දෙහිඕවිට ප්‍රාදේශීය සභාව, දෙහිඕවිට යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත අතින් ගෙනැවිත් භාරදෙන ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ.".

ඩබ්. ඩී. එස්. පී. වල්පොල,
ලේකම් හා බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 මැයි මස 03 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-100

**කොළඹ මහා නගර සභාව**

ගෝඝාතක ආඥාපනත (272 වැනි පරිච්ඡේදය)

මතු සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය විසින් එකී නම ඉදිරියෙන් විස්තර දක්වා ඇති ස්ථානයට 2024 වර්ෂය තුළ මස් විකිණීමට අදාළව කටයුතු පවත්වාගෙන යාම පිණිස ගෝඝාතක බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව කොළඹ මහා නගර සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් වශයෙන් සකස් කර මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වී දින 14 කර ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 7(2) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජේ. එම්. හඳානි ජයවර්ධන,
කොළඹ මහා නගර සභාවේ නාගරික
කොමසාරිස් හා සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

2024 අප්‍රේල් මස 21 වැනි දින,
නගර ශාලාව,
කොළඹ 07.

**උපලේඛන 01**

| *අනු. අංකය* | *ටෙන්ඩර්කරුගේ නම* | *කඩ අංකය* | *වෙළඳ ස්වභාවය* |
|---|---|---|---|
| බොරැල්ල පොදු වෙළඳ සංකීර්ණය | | | |
| 1 | එච්. එන්. එම්. රිස්නි මයා | 7/B/26 | ගව මස් |
| 2 | එච්. බී. එෆ්. ඉනායා මිය | 7/B/29 | ගව මස් |
| 3 | එස්. ඕමාර් කත්තා මයා | 7/B/30 | ගව මස් |
| 4 | සී. එම්. එස්. නසාර් මයා | 7/B/31 | එළු මස් |
| 5 | එස්. ඕ. කත්තා මයා | 7/B/37 | ගව මස් |
| 6 | එස්. එම්. එස්. මුබාරක් මයා | 7/B/41 | ගව මස් |
| 7 | එච්. එන්. එම්. රිස්නි මයා | 7/B/42 | ගව මස් |
| 8 | එස්. එච්. එන්. රහීම් මයා | 7/B/43 | එළු මස් |
| 9 | ඒ. ඩී. ආර්. එන්. බර්නදෙත් මිය | 7/B/55 | ඌරු මස් |
| ඩීන්ස් පාර පොදු වෙළඳපොළ | | | |
| 10 | එම්. වයි. ඕ. කේ. ඉක්බාල් මයා | 44/03 | ගව මස් |
| 11 | එම්. බී. එම්. ඉසාම්ඩීන් මයා | 44/06 | ගව මස් |
| 12 | ආර්. එම්. අනාස් මයා | 44/07 | එළු මස් |
| 13 | එම්. එස්. එම්. ඉක්බාල් මයා | 44/08 | ගව මස් |
| 14 | එන්. එම්. එම්. රබීක් මයා | 44/09 | ගව මස් |
| 15 | පලනි බාලක්‍රිෂ්ණන් මයා | 44/11 | එළු මස් |
| 16 | එම්. එස්. එම්. මුසාජි මයා | 44/14 | ගව මස් |

| අනු. අංකය | ටෙන්ඩර්කරුගේ නම | කඩ අංකය | වෙළඳ ස්වභාවය |
|---|---|---|---|
| කොල්ලුපිටිය පොදු වෙළඳපොළ | | | |
| 17 | බී. පී. ජේ. කුමාර මයා | 01/ඒ | ඌරු මස් |
| 18 | එස්. බී. එම්. ඉර්ෂාඩ් මයා | 3 | එළු මස් |
| 19 | එස්. එම්. ශාබ්රින් මයා | 4 | ගව මස් |
| 20 | එම්. එස්. එම්. රිකාස් මා | 11 | එළු මස් |
| 21 | එස්. එච්. එම්. ෂෆ්රාස් මයා | 12 | ගව මස් |
| බම්බලපිටිය පොදු වෙළඳපොළ | | | |
| 22 | එන්. එම්. එස්. ඩාවුඩ් මයා | 21 | ගව මස් |
| 23 | එස්. සහිෂාන් මයා | 22 | ගව මස් |
| 24 | එන්. කේ. එම්. නිහාර් මයා | 23 | එළු මස් |
| 25 | එස්. ඕ. එම්. රියාල් මයා | 25 | ගව මස් |
| වැල්ලවත්ත පොදු වෙළඳ පොළ | | | |
| 26 | ඒ. සී. එන්. මොහොමඩ් මයා | 1 | ගව මස් |
| 27 | එම්. ආර්. මොහිදීන් මයා | 3 | ගව මස් |
| 28 | එච්. ආර්. එම්. ෆාහිම් මයා | 4 | ගව මස් |
| 29 | එම්. ඒ. යූසුෆ් මයා | 1 | එළු මස් |
| 30 | එම්. අයි. එන්. බාන් මයා | 2 | එළු මස් |
| මාලිගාවත්ත පොදු වෙළඳපොළ | | | |
| 31 | එන්. එම්. එම්. මුස්තකීන් මයා | 2 | එළු මස් |
| 32 | එම්. ආර්. එම්. නව්ෂාඩ් මයා | 4 | ගව මස් |
| 33 | එම්. කේ. එම්. වෂීම්ඩීන් මයා | 5 | ගව මස් |
| 34 | එම්. කේ. එම්. වෂීම්ඩීන් මයා | 6 | ගව මස් |
| 35 | එම්. කේ. එම්. වෂීම්ඩීන් මයා | 7 | ගව මස් |
| 36 | එම්. කේ. එම්. වෂීම්ඩීන් මයා | 8 | ගව මස් |
| 37 | එම්. කේ. එම්. වෂීම්ඩීන් මයා | 9 | ගව මස් |
| කොටහේන පොදු වෙළඳපොළ | | | |
| 38 | බී. එස්. එම්. රශීඩ් | 11 | ගව මස් |
| 39 | අයි. එච්. බී. එස්. තුල්කාර්නි මයා | 13 | ගව මස් |
| 40 | එම්. එෆ්. එම්. රියාස් මයා | 14 | එළු මස් |
| 41 | එම්. එච්. එම්. ශරීෆා මිය | 17 | එළු මස් |
| ජාතික පොළ වෙළඳපොළ | | | |
| 42 | මොහොමඩ් රුමී මයා | 275 | ගව මස් |
| 43 | මොහොමඩ් රුමී මයා | 277 | එළු මස් |

| *අනු. අංකය* | *ටෙන්ඩර්කරුගේ නම* | *කඩ අංකය* | *වෙළඳ ස්වභාවය* |
|---|---|---|---|
| කොස්ගස්හන්දිය පොදු වෙළඳපොල | | | |
| 44 | ඒ. එස්. එම්. බී. නිසාර් මයා | 10/08 | ගව මස් |
| 45 | එම්. එෆ්. ජවුෆර් මයා | 10/09 | ගව මස් |
| 46 | ඒ. කේ. එස්. හමීඩ් මයා | 10/10 | එළු මස් |
| 47 | එම්. බී. එන්. එම්. අසීම් මයා | 10/11 | ගව මස් |
| 48 | ඉසෙඩ්. ඒ. එම්. සාරාස් මයා | 10/12 | ගව මස් |
| ජින්තුපිටිය පොදු වෙළඳපොල | | | |
| 49 | ඒ. එච්. එම්. අබ්රාර් මයා | 7 | එළු මස් |
| විස්ට්වයික් පොදු වෙළඳපොල | | | |
| 50 | කේ. එම්. තන්සිල් මයා | 30/4 | ගව මස් |
| 51 | එෆ්. එම්. එම්. ෆාරුක් මිය | 30/6 | ගව මස් |
| නාගලගම්වීදිය පොදු වෙළඳ පොළ | | | |
| 52 | එම්. ඒ. කේ. එම්. යාසින් ඛාන් මයා | 381/6 | එළු මස් |
| 53 | ඒ. ආර්. එම්. අලිඛාන් මයා | 381/3 | ගව මස් |
| 54 | එම්. ඒ. කේ. එම්. යාසින් ඛාන් මයා | 381/4 | ගව මස් |
| 55 | ඒ. ආර්. එම්. අලිඛාන් මයා | 381/5 | ගව මස් |
| මෝදර පොදු වෙළඳපොල | | | |
| 56 | ඒ. ආර්. එම්. අලිඛාන් මයා | 4 | ගව මස් |
| කිරුළපන පොදු වෙළඳපොල | | | |
| 57 | ඒ. ඩී. ආර්. නිර්මලා බර්නදෙත් මිය | 103 | ඌරු මස් |
| 58 | ජේ. ඒ. එම්. ෆවුම් මයා | 147 | එළු මස් |
| 59 | එම්. එච්. එම්. ෆසාල් මයා | 148 | ගව මස් |
| 60 | එම්. අයි. එන්. රාසික් මයා | 150 | ගව මස් |
| කොම්පඤ්ඤවීදිය පොදු වෙළඳපොල | | | |
| 61 | එම්. එස්. නිහාර්ඩීන් මයා | 1 | එළු මස් |
| 62 | එම්. එච්. බී. නිසාර් මිය | 2 | ගව මස් |
| 63 | කේ. එම්. ෆවුස්දීන් මයා | 3 | ගව මස් |
| 64 | එස්. එම්. තාවුස් මයා | 4 | ගව මස් |

| පෞද්ගලික ගවමස් වෙළඳසැල් | | |
|---|---|---|
| | *නම* | *ස්ථානය* |
| 1. | එම්. එච්. එම්. නිලාම් මයා | අංක 324, දෙමටගොඩ පාර, කොළඹ 09 |
| 2. | කේ. එම්. සහිඵුල්ලා මයා | අංක 07, ද මැල් වීදිය, කොළඹ 02 |
| 3. | ජේ. ජේ. ජමාල් මයා | අංක 07ඒ, ද මැල් වීදිය, කොළඹ 02 |
| 4. | එස්. නිහාර්ඩීන් මයා | අංක 07බී, ද මැල් වීදිය, කොළඹ 02 |
| 5. | ඩී. ඉවෝන් මොරින් කීගල් මිය | අංක 102, ශාන්ත අන්තෝනි පාර, කොළඹ 13 |
| 6. | ආර්. ඒ. ෆාතිමා නසීරා මිය | අංක 02, හල්ස්ඩෝෆ් පාර, අලුත් යොන් වීදිය, කොළඹ 12 |
| 7. | ඒ. ආර්. එම්. අලිඛාන් මයා | අංක 488, මාදම්පිටිය පාර, කොළඹ 14 |
| 8. | එම්. එෆ්. ජෙයිනුල් ආබ්දීන් මයා | අංක 97, අබ්දුල් හමීඩ් වීදිය, කොළඹ 12 |
| 9. | ටී. කේ. එන්. ෆරීනා මිය | අංක 211/52, ජුම්මා මස්ජිඩ් පාර, කොළඹ 10 |
| 10. | එම්. ටී. ආර්. අමීර් මයා | අංක 01, හුසේනියා වීදිය, කොළඹ 12 |
| 11. | එම්. එම්. එම්. රිල්වාන් මයා | අංක 227, ලෙයාඩ්ස් බ්‍රෝඩ්වේ, කොළඹ 14 |
| 12. | එම්. ආර්. එම්. රම්ලි මයා | අංක 195, මීරානියා වීදිය, කොළඹ 12 |
| 13. | එම්. ටී. ආර්. අමීර් මයා | අංක 111/2, මධ්‍යම පාර, පිටකොටුව, කොළඹ 12 |
| 14. | එස්. එම්. ෂුක්රි මයා | අංක 226, මොහිදීන් මස්ජිඩ් පාර, කොළඹ 10 |
| 15. | ඒ. එස්. මිලාත් නිසා මිය | ඒ. ජී. 05, විතානගේ මාවත, කොළඹ 02 |
| 16. | ඒ. එස්. එම්. ෆාහිම් මයා | අංක 111/13, විවේකානන්ද පාර, කොළඹ 13 |
| පෞද්ගලික එළු මස් වෙළඳසැල් | | |
| 17. | ඒ. සේතුන් නරීෆා මිය | බී. ජී. 07, මිහිඳු මාවත, කොළඹ 12 |
| පෞද්ගලික ගව/එළු/ඌරු මස් වෙළඳ සැල් | | |
| 18. | කාගිල්ස් ලංකා පුද්ගලික සමාගම | අංක 40, යෝක් වීදිය, කොළඹ 01 |
| 19. | ජේ. කේ. මාකටින්ස් (පුද්.) සර්විසස් කීල්ස් ෆුඩ් ප්‍රොඩක්ට්ස් පී. එල්. සී. | අංක 148, වෝක්ෂෝල් වීදිය, කොළඹ 02 |

05-53

# විවිධ දැන්වීම්

## ගම්පොළ නගර සභාව

### වීගුලවත්ත ක්‍රීඩාංගනයේ ලණු පැදුර(මැට්න්) සඳහා ගාස්තු අය කිරීම - 2024

2018.03.15 දිනැති අංක 2061/4 දරන අති විශෙෂ ගැසට් පත්‍රය ප්‍රකාර 2018.03.20 දින ආරම්භ වී 2022.03.19 දින සභිකයින්ගේ ධුර කාලය අවසන් වීමට නියමිතව තිබී 2022.01.10 දිනැති අංක 2262/8 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙන් 2023.03.19 දින දක්වා දීර්ඝ කරනු ලැබූ ගම්පොළ නගර සභාවේ සභියකයින්ගේ ධුර කාලය 2023.03.19 දිනෙන් අවසන් වී ඇති බැවින් 2023.03.20 දින සිට ගම්පොළ නගර සභාවේ ලේකම් ධුරයේ රාජකාරි කරන යූ. ජී. ජයරත්න වන මා 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184 අ වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වීගුලවත්ත ක්‍රීඩාංගනය සඳහා අලුතින් මිල දී ගන්නා ලද ලණු පැදුර (මැට්න්) සඳහා තරගාවලියක එක් දිනක් වෙනුවෙන් රු. 4,000ක මුදලක් අය කිරීමට 2024.02.27 වන දින තීරණ අංක 2024/283 යටතේ මා තීරණය කරමි.

යූ. ජී. ජයරත්න,<br>
ලේකම්,<br>
ගම්පොළ නගර සභාව.

2024 අප්‍රේල් මස 22 වැනි දින,<br>
ගම්පොල නගර සභා කාර්යාලයේ දී ය.

05-61

---

## සංශෝධනයයි

## බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

### 2024 වර්ෂය සඳහා පළ වූ විවිධ ගාස්තු පැනවීමේ ගැසට් නිවේදනය සංශෝධනය කිරීම

2023.12.01 දින අංක 2361 දරන *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 12-64/11 යටතේ පළ කරන ලද විවිධ ගාස්තු පැනවීම පිළිබඳ ගැසට් නිවේදනයේ සඳහන් උපලේඛනය පහත පරිදි සංශෝධනය කරන බව මෙයින් නිවේදනය කරමි.

**2024 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම**

***තීරණය***

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරන පහත සඳහන් සේවා සඳහා වෙනත් ආනුෂංගික කාර්යන් ඉටු කිරීමේදී ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත් මෙම සේවා ගාස්තු අය කිරීම "2024 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු බව මා විසින් තීරණය කරමි.".

**1 වන උපලේඛනය**

| *අනු. අංකය* | *සේවාව* | *ගාස්තුව (රු.)* |
|---|---|---|
| 01 | ඔප්පු සාරාංශ අයදුම්පත් | 500 0 |
| 02 | වරිපනම් සහතිකයක් නිකුත් කිරීම | 300 0 |

2021 ජූලි මස 08 දින අංක 2235/54 දරන අතිවිශෙෂ *ගැසට්* නිවේදනයේ 2 වන උප ලේඛනය ප්‍රකාරව, බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීමේ දී පෙරසැරි ගාස්තු අය කිරීම ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු අය කිරීම, අනුකුලතා සහතිකය නිකුත් කිරීමේ ගාස්තු අය කිරීම "2024 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද මා විසින් තීරණය කරමි.".

**2 වන උපලේඛනය**

| *අනු. අංකය* | *සේවාව* | *ගාස්තුව (රු.)* |
|---|---|---|
| 01 | ඉඩම් අනු බෙදුම් අයදුම්පතක් | 500 0 |
| 02 | ගොඩනැගිලි අයදුම්පත්‍රය | 500 0 |

දීප්ති වික්‍රමරත්න,
ලේකම්,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2024 මාර්තු මස 22 වැනි දින.

05-94/1

---

සංශෝධනයයි

**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා පළ වූ විවිධ ගාස්තු පැනවීමේ ගැසට් නිවේදනය සංශෝධනය කිරීම

2023.12.01 දින අංක 2361 දරන *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 12-64/10 යටතේ පළ කරන ලද පුස්තකාල ගාස්තු පැනවීම පිළිබඳ ගැසට් නිවේදනයේ සඳහන් උපලේඛනය පහත පරිදි සංශෝධනය කරන බව මෙයින් නිවේදනය කරමි.

**2024 වර්ෂය සඳහා පුස්තකාල ගාස්තු පැනවීම**

***තීරණය***

"බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.08.23 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ 36 වන "පුස්තකාල" පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙන් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව මුල් වරට සාමාජිකත්වය ලබා ගන්නා තැනැත්තෙක් වන විට පහත ගාස්තුන් ගෙවා සාමාජිකත්වය ලබා ගත යුතුය."

**උපලේඛනය**

| *අනු. අංකය* | *විස්තරය* | *ගාස්තුව (රු.)* |
|---|---|---|
| 01 | අයදුම්පත් ගාස්තුව | 50.00 |
| පාසල් සිසුන් සඳහා | | |
| 01 | අයදුම්පත් ගාස්තුව | 50.00 |

ප්‍රමාද වන දිනකට අය කරනු ලබන ප්‍රමාද ගාස්තුව දින 01 සඳහා රු. 1.00කි.

මෙම තීරණය 2024 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි මා විසින් තීරණය කරමි.

දීප්ති වික්‍රමරත්න,
ලේකම්,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2024 මාර්තු මස 22 වැනි දින.

05-94/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.